විශාල මැහෝගනී ගස යට වූයේ කුඩා පැල්පතකි.මෙහි ජීවත් වූයේ සිරිමල් හා ඔහුගේ දෙමවුපියනුත් කුඩා නැගණියත් පමණයි.
සිරිමල්ගේ අප්පච්චි කලේ කුලී වැඩ. අම්මා පුංචි නංගි බලාගෙන ගෙදර හිටියා. අප්පච්චි කොච්චර මහන්සි වෙලා වැඩ කලත් ලැබුනේ ඉතා කුඩා ආදායමක්.නිවසේ අගහිඟකම් නම් නොඅඩුව පැවතුණා.මේ ගැන සිතමින් උන් සිරිමල් දිනක් නිවසින් එලියට බැස්සේ මින් ගැලවීමේ දැඩි අධිෂ්ඨානයකිනි.ඇවිදගොස් විඩාවට පත් සිරිමල් ගිමන්හැරීමට නැවතුනේ පාර අද්දර තිබූ විශාල

පලතුරු වත්තක් අසලිනුයි. පලතුරු ගස්වල ගෙඩි පිරී තිබුනු අතර බිමටද වැටී තිබුනා.මේ දුටු සිරිමල් "මේ පලතුරු ටිකක් ඇහිදගත්තානම් මට මේවා පැල කරලා, ලැබෙන පලතුරුවලින් මොකක්

හරි ආදායමක් ගන්න තිබුනා"කියලා හිතුවා.ඊට පස්සේ හිමින් සැරේම පලතුරු වත්තට ඇතුලුවුන සිරිමල් නැවතුනේ අඹ ගසක් යට. අඹ ගස යට පලතුරු ගොඩක් වැටිලා තිබුනා.සිරිමල් මේ අඹ ඇහිදින්න ගත්තා. එක්වරම

කවුරුහරි කෑ ගහන සද්දයක් ඇහුණා. වත්තේ අයිතිකරු තමා දෙසට පැමිනෙණවා දුටු සිරිමල් දුවන්න සැරසුණා. ඒත් ඊට පෙර පැමිණි වත්තේ අයිතිකරු සිරිමල්ව අල්ලා ගත්තා."ඇයි අඹ හොරකම් කරන්න හැදුවේ ?" වත්තේ අයිතිකරු සිරිමල්ගෙන් ඇහුවා. "අනේ මම හොරකම් කරන්න හැදුවෙ නෑ. මගේ අම්මටයි, අප්පච්චිටයි සල්ලි නැහැ. අපි හරි අමාරුවෙන් ජීවත් වෙන්නෙ. මම අඹ ටිකක් අහුල ගත්තේ පැළ කරන්න හිතාගෙන"කියලා සිරිමල් කිව්වා.මේ කතාවට වත්තේ

අයිතිකරුට ගොඩක් දුක හිතුනා."හොඳයි කමක් නැහැ, මොනවා උනත් ඔයා ඇත්ත කිව්වනේ.මීට පස්සෙ ඇවිත් ඕනි තරමක් අඹ අරගෙන යන්න.ආ...මේ සල්ලි ටිකත් තියාගන්න. තව මොනවා හරි ඕනි උනොත් කියන්න, මගෙ කඩේ තියෙන්නේ මේ ළගමයි" කියලා ඔහු කාරුණිකව කිව්වා.වත්තේ අයිතිකරු ඉන්පසුව මුදල් නෝට්ටු කිහිපයක් සිරිමල් අත තැබුවා.ඔහුට ස්තූති කළ සිරිමල් නිවස වෙත දිවගියේ ඉතාමත් සතුටින්.

පසුදින උදෑසන අප්පච්චි රැකියාවට යාමට සූදානම් වෙද්දී ඔහු අසලට ගිය සිරිමල්, පෙරදින වුන සිද්ධිය විස්තර කලා. ඉන්පසු මුදල් නෝට්ටු කිහිපය අප්පච්චි අත තැබුවේ නැවත නිවසට එන විට රෝපණය කිරීම සඳහා විවිධ පලතුරු වර්ගවල බීජ රැගෙන එන ලෙස පවසමින්. අප්පච්චී සවස නිවසට පැමිණෙන විට බොහෝ පලතුරු බීජ වර්ග රැගෙන විත් තිබුනා.

පසුදින සිරිමල් කිසිදු වගාවක් කර නොතිබුනු ඔවුන්ගේ වත්තේ, එම බීජ රෝපණය කලා. ඉන්පසු ඔහු

පෙර රැගෙන විත් තිබූ අඹවල බීජ ද එම වත්තේම රෝපණය කළා.

සිරිමල් උනන්දුවෙන් හා මහන්සියෙන් කල වගාව දිනෙන් දින සරුසාරව වැඩුනා. ටික කාලයක් ගත වෙද්දී ඔහුගේ මහන්සියේ ප්‍රතිපල ලෙස පලතුරු ගස්වල හොඳින් පලදාව හටගෙන තිබුනා. අඹ ගස් ආදිය ගෙඩිවලින් පිරී තිබුනා. ඔහු එම පලදාව නෙලා ගත්තා.සිරිමල් බලාපොරොත්තු වූවාටත් වඩා පලදාවක් ලැබුන නිසා ඔහුට දැනුනේ ලොකු සතුටක්.

සිරිමල් තමන්ට උපකාර කළ වත්තේ අයිතිකරුව අමතක කලේ නැහැ. ඔහු තමන්ගේ පලමු පලදාවම රැගෙන ගියේ වත්තේ අයිතිකරුගේ වෙළඳසැලට. ඔහුත් සාධාරණ මුදලක් සිරිමල්ට ලබා දුන්නා. සිරිමල් එම මුදලිනුත් පලතුරු බීජ සහ පොහොර ආදිය මිලදී ගත්තා. තවත් ටික කාලයක් ගත වෙද්දී ඔහුට හිමි වුනේ සරුසාර පලතුරු වගාවක්.ඔහු එමගින් හොඳින් මුදල් උපයා ගත්තා. එම මුදලින් දෙමව්පියන්ටත් හොඳින් සැලකුවා.ඔහුට පලතුරු ගැනුම්කරුවන් බොහෝමයක්

සිටියා. ලැබුණු මුදල් වලින් ඔහු තවත් ඉඩමක් මිලදී ගත්තා.එහිද පලතුරු වගා කළා.ගුණදායක හා නැවුම් පලතුරු තිබූ නිසා ඔහුට හැකිවුනා පලතුරු විදේශයන්ට ද අලෙවි කරන්න. ඔහුට එමගින් විශාල මුදලක් උපයා ගත හැකි වුනා. එදා අසරණ දරුවෙක්ව සිටි සිරිමල් අද වන විට ඉතා හොඳ ව්යාපාරිකයෙක්.ඔහුට මේ තරම් දුරකට එන්න උපකාර උනේ ඔහුගේ හොඳ ගතිගුණ හා දැඩි කැපවීමයි. ඔහු තමාගේ ව්යාපාර කටයුතු තවත් දියුණු කළා. තවත් ඉඩම් මිලදීගත් සිරිමල් ඒවායෙන් පලතුරු

වගා කළා.ඒවා රැක බලා ගැනීමට සේවකයනුත් යෙදෙව්වා.

තවත් ටික කාලයක් ගත වුනා.සිරිමල් විවාහයක් කර ගත්තා. දැන් ඔහුට කුඩා දියණියකුත් ඉන්නවා. ඔහු තමාගේ එකම දරුවාට පණ මෙන් ආදරය කළා. ඔහු දැන් රටේ ප්‍රධාන පෙලේ ව්‍යාපාරිකයෙක් නිසා ඔහුට ආශ්‍රය කරන්න ලැබුණේ ඒ වගේම අය. මේ අය අතර තිබුනේ මුදල් සෙවීමේ තරගයක්. සිරිමලුත් මේ

තරගෙට වැටුණේ නොදැනුවත්වම යි.

පලතුරු අපනයනයෙන් ඉතා විශාල මුදලක් ඉපැයුවත් සිරිමල්ට උවමනා වුනේ තවත් මුදල් උපයන්න. මේ නිසා සිරිමල් පලතුරු බීම කර්මාන්තයක් ආරම්භ කළා. මේ පලතුරු බීම නිපැදවූයේ ස්වභාවික පලතුරු වලින්. මේ බීම නැවුම් නිසාත්, ගුණදායක නිසාත් බොහෝ දෙනෙක් මේවා මිලදී ගත්තා. එනිසා පලතුරු බීම කර්මාන්තයෙනුත් සිරිමල්ට ඉතා හොද ආදායමක් ලබා ගන්න පුළුවන් වුණා.ඒත්

ඔහුගේ ආශාව නැති වූයේ නැහැ.ඒ නිසා සිරිමල් මෙහෙම හිතුවා "මම මේ බීම කර්මාන්තයෙන් මීට වඩා සල්ලි උපයන්න ඕනි.මම මේ බීම නිපදවන්ට පලතුරු වෙනුවට පලතුරු රසැති රසකාරක යොදා ගත්තා නම් හරි. හැබැයි මේ ගැන මිනිස්සුන්ට දැන ගන්න තියන්න හොද නෑ. එහෙම උනොත් ආදායම අඩු වෙන්න ඉඩ තියෙනවා.ඒක නිසා කර්මාන්තශාලාවේ බීම නිෂ්පාදනය කරන අංශයට මගේ ඉතාමත් හිතවත් සේවකයන් යොදවන්න ඕනෑ. ඒ වගේම ඒගොල්ලන්ට වැඩිපුර වැටුපකුත්

දෙන්න ඕනි." මෙහෙම හිතපු සිරිමල් එදා ඉදලා බීම නිශ්පාදනයට පලතුරු වෙනුවට අහිතකර රසකාරක යොදා ගත්තා.පලතුරු වලින් නිපදවනවා වගේම උකුවට එන්න ඕනි නිසා බීම නිෂ්පාදනයට අහිතකර රසකාරක විශාල ප්රමාණයක් යොදා ගැනීමට සිදුවුණා. ඒ වුනාට පලතුරු යොදාගෙන නිෂ්පාදනය කරනවා මෙන් දෙගුණයක මුදලක් මෙමගින් සිරිමල්ට උපයා ගන්ට පුළුවන් වුණා. ඔහු පාරිභෝගිකයන්ට කිව්වේ මේවා ඉතා ගුණදායක, නැවුම් බීම කියලයි.බීම නිශ්පාදනය කරන

අංශයට හිතවත් සේවකයන් යොදවපු නිසයි, ඒගොල්ලන්ට වැඩිපුර වැටුපක් දීපු නිසයි මේ ගැන කාටවත් දැනගන්න ලැබුනෙත් නෑ.

තවත් ටික කාලයක් ගතවුණා. දුව පැන සෙල්ලම් කරමින් සිටි සිරිමල්ගේ දුව හදිසියේම අසනීප වුණා. ඇයව රෝහල් ගත කරන්නට සිදු වුණා. එහිදී සිදු කල පරීක්ෂණ වලින් අනාවරණය වූයේ දුක්මුසු පුවතක්. ඒ ඔහුගේ දියණියට පිළිකාවක් වැළඳී ඇති බවයි. සිරිමල් මීට හේතුව සොයා බැලුවා. එවිට

ඔහුට දැනගන්න ලැබුනේ ඔහුගේ කර්මාන්ත ශාලාවේ නිශ්පාදනය කල විෂ සහිත බීම දියණිය දිනපතා පානය කර ඇති බවයි. දියණියගේ රෝගය දිනෙන් දින උත්සන්න වුණා. සිරිමල් තමාගේ එකම දරුවා සුවකර ගැනීම සඳහා විශාල වශයෙන් මුදල් වියදම් කලා.

සිරිමල්ගේ බීම කර්මාන්තයටද මිනිසුන්ගේ දෝෂාරෝපණ එල්ල වුනා. එම නිසා බීම කර්මාන්තයද කඩා වැටුනා.බීම කර්මාන්තයට එල්ල වුණ දෝෂාරෝපණ නිසා පලතුරු වතුවල වැඩ කරන්න

සේවකයො ආවෙත් නැහැ.ඒ නිසා පලතුරු වතු ටිකත් විනාශ වුණා. තමන්ගේ දියණියගේ අසනීපය සුව කරගන්න ඕනි නිසා සිරිමල් බීම කර්මාන්තශාලාව විකුණා දැමුවා.එම මුදලින් ඔහු තමන්ගේ දියණියව ප්‍රතිකාර කිරීම සඳහා පිටරට පවා යැව්වා.

අවසානයේදී සිරිමල්ට තමාගේ මුලු සේසතම නැති වුණා.ඒ වගේම ඔහුගේ එකම දරුවා ද මියගියා. සිරිමල්ව තමාගේ ජීවිතය ආරම්භ කළ පැල්පතටම ඇද වැටුනා.